# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2009

## (2010 මැයි / ජූනි)

## මානවශාස්ත්‍ර පීඨය

## ප්‍රතිබිම්බ කලා - IMAT –E2015

## චිත්‍රපට හා රූපවාහිනී මාධ්‍යයේ කේත හා සම්මුති

**පුශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි　　　　　　　　කාලය : පැය 03 යි

---

01. චිත්‍රපට මාධ්‍යය හා රූපවාහිනී මාධ්‍යය අතර දක්නට ලැබෙන සමාන හා අසමාන ලක්ෂණ සන්සන්දනය කරන්න.

02. කතාන්දර කීමේ කලාවක් හැටියට වෘත්තාන්ත චිත්‍රපටය, නවකතාවෙන් හා වේදිකා නාට්‍යයෙන් වෙනස්වන ආකාරය පෙන්වා දෙන්න.

03. චිත්‍රපටයක් හෝ ටෙලිනාට්‍ය නිර්මාණයක් සඳහා තිර රචනයක් අවශ්‍ය වන්නේ ඇයි ද යන්න හේතු දක්වමින් පැහැදිලි කරන්න.

04. චිත්‍රපට රූප (Shots) වර්ගීකරණයක් ඉදිරිපත් කොට ඒවායේ මූලික ලක්ෂණ හා භාවිතය පිළිබඳ විස්තරයක් කරන්න.

05. රූප සංරචනය යනු කුමක්දැයි පැහැදිලි කොට එය චිත්‍රපටයක අර්ථ ප්‍රකාශනයට හා නිර්මාණශීලී ගුණය තීව්‍ර කිරීමට තුඩුදෙන ආකාරය නිදසුන් මඟින් සනාථ කරන්න.

06. චිත්‍රපටයක නිෂ්පාදන ක්‍රියාවලිය, ප්‍රධාන අදියර තුන යටතේ සිදුවන ආකාරය විස්තර කරන්න.

07. රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ක්‍රමවේද හතර හඳුන්වා දී, ඒ අතරින් වඩාත් බැරෑරුම් හා සංකීර්ණ නිෂ්පාදන ක්‍රමවේදය ලෙස ඔබ සලකන්නේ කුමක්ද යන්න හේතු සහිතව පෙන්වා දෙන්න.

08. ටෙලි නාට්‍ය වර්ගීකරණයක් ඉදිරිපත් කොට ඒවායේ අන්තර්ගතය හා ආකෘතික ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

09. " චිත්‍රපටයක් නිර්මාණාත්මක අයුරින් සැකසෙන්නේ සංස්කරණ මැදිරියේ දීය "සංස්කරණ ශිල්පියාගේ කාර්යභාරය විමසා බලමින් මෙම අදහස තහවුරු කරන්න.

****************